**පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාව.**

**මහනුවර දිස්ත්‍රික්කය.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

**සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.**

**1.2 තත්ත්වාගණනය කළ මතය**

**මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පස්බාගේ කෝරලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම.**

**1.3.1 නොසැසඳු පාලන ගිණුම්.**

**දේශීය ණය සංවර්ධන අරමුදලේ ශේෂය ගිණුමට අනුව රු.14,431,934 ක් වුවත්, ශේෂ සනාථ කිරීමේ ලිපිය අනුව එය රු.14,362,340 ක් වූයෙන්, රු.69,594 ක වෙනසක් නිරීක්ෂණය විය.**

**1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්.**

**(අ) ලැබිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 14 ක එකතු වටිනාකම රු.24,220,827 ක් වූ අතර, එයින් අවුරුදු 5 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්වල එකතුව රු.1,614,510 ක් වී තිබුණි. මෙම ශේෂයෙන් 2017 මැයි 30 දිනට රු.23,187,064 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**(ආ) ගෙවිය යුතු ගිණුම්.**

**2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු.15,956,704 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 11 ක අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්වල එකතුව රු.3,329,259 ක් විය. මෙම ශේෂයෙන් 2017 මැයි 30 දිනට රු.7,218,574 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**1.3.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම.**

**ගිණුම් විෂයයන් 2 කට අදාළ අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.1,250,333 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**1.3.4 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178 (10)(2) වගන්තිය | සමර්ථ ටෙන්ඩර්කරුට ලියාපදිංචි තැපෑලෙන් ටෙන්ඩරය පිළිගත් බවට දන්වා යැවිය යුතු වුවත්, ඒ බව වාචිකව දන්වා තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසී 571(3) | 2014 වර්ෂයේ අවස්ථා 3 කදී ඉදි කිරිම් කොන්ත්‍රාත් වෙනුවෙන් රඳවා ගත් රු.25,907 ක් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ඇ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/ 46 දරන චක්‍රලේඛයේ 7 ඡේදය. | කඩ කාමර අතුරු බදු දීම සම්පූර්ණයෙන් තහනම් කර ඇති අතර, අතුරු බදු දි ඇති අවස්ථාවක දි බදුකරුගේ බලපත්‍රය අවලංගු කළ යුතු වුවද, සභාවේ කඩ කාමර 7 ක් අතුරු බදු දි තිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.12,951,380 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වැඩිවූ ආදායම රු.12,168,211 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.783,169 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2** ආදායම් පරිපාලනය.

-----------------------

**2.2.1** වරිපනම්.

----------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) **2016** ජනවාරි **01** දිනට හිඟ හිටි වරිපනම් ශේෂය රු.**375,271** ක් වූ අතර, **2016** දෙසැම්බර් **31** දින දක්වා බිල් කිරීම් රු.**576,600** ක් විය. මින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දින වන විට අය කර තිබුණේ පිළිවෙළින් රු.**92,740** ක් හා රු.**362,658** ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට **25** ක් හා සියයට **63** ක් විය. **2016** දෙසැම්බර් **31** දිනට රු.**496,473** ක හිගයක් නිරීක්ෂණය වූ අතර, හිඟ ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) වර්ෂ **5** කට වරක් නව තක්සේරුවක් කර බදු අය කළ යුතු වුවත්, සභාව විසින් **2009** වර්ෂයෙන් පසු නව තක්සේරුවක් සිදු නොකර පැරණි තක්සේරුව පදනම් කර ගනිමින් **2016** වර්ෂයට වරිපනම් බිල් කර තිබුණි.

**2.2.2** වෙනත් ආදායම්.

-------------------

දැන්වීම් පුවරු ගාස්තු.

-------------------------

**2015** දෙසැම්බර් **11** දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇති **2016** වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් හා දෘශ්‍ය පරිසරය පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව දැන්වීම් පුවරු ගාස්තු අය කිරීමට සභාව කටයුතු කර නොතිබූ අතර, සභා බල ප්‍රදේශය තුළ දැන්වීම් පුවරු සංගණනයක් ද සිදු කර නොතිබුණි.

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු.

---------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් **2016** දෙසැම්බර් **31** දිනට උසාවි දඩ රු.**400,000** ක් හා මුද්දර ගාස්තු රු.**5,000,000** ක් අය විය යුතුව තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය.**

**3.1** **කාර්යසාධනය.**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ)** **සභා අරමුදල් යටතේ සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිම.**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

**(i)** **සභා අරමුදල් යටතේ සමාලෝචිත වර්ෂයේ දී හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ එකතු වටිනාකම රු.1,677,823 ක් වූ ව්‍යාපෘති 11 ක් අවස්ථා 3 කදී ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමත කර තිබූ නමුත්, ඉන් රු.709,829 ක් වටිනා ව්‍යාපෘති 3 ක වැඩ 2016 දෙසැම්බර් 31 දින වන විටත් අවසන් කර නොතිබුණි.**

**(ii)** **සභාව විසින් එක් එක් වර්ෂයන්ට අදාළ ස්වයං උත්පාදන ආදායමෙන් සියයට 30 කට වඩා වැඩි ප්‍රතිශතයක් පනතේ අරමුණු ඉටු වන ආකාරයෙන් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.45,983,226 ක පුනරාවර්තන ආදායමක් උපයා ගෙන තිබියදී, ඉන් සංවර්ධන කටයුතු සඳහා යොදවා තිබුණේ රු.2,213,343 ක් වූ සියයට 5 ක් තරම් අඩු ප්‍රතිශතයකි.**

**(ආ)** **ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම.**

**පහත නිරීක්ෂණයන් කෙරේ.**

**(i)** **මෙම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති 14 ක් සභාව විසින් 2016 ජුනි 02 දින අනුමැතියට යවා තිබූ අතර, එම ව්‍යාපෘතිවලින් 2016 අගෝස්තු 29 හා සැප්තැම්බර් 14 දිනයන් හි ව්‍යාපෘති 12 කට පළාත් පාලන අමාත්‍යාංශය විසින් අනුමැතිය ලබා දී තිබුණි. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.1,550,000 ක් වටිනා අනුමත ව්‍යාපෘති 11 ක වැඩ ආරම්භ කර නොතිබුණි.**

**(ii)** **2016 සැප්තැම්බර් 28 දින සභාව විසින් ඔක්තෝබර් මාසයේ ක්‍රියාත්මක කිරීමට නියමිත රු.1,951,797 ක් වටිනා ව්‍යාපෘති 14 කට අනුමැතිය ලබා දෙන ලෙස නැවත ඉල්ලා ඇතත්, සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘති 14 ට අනුමැතිය ලැබී නොතිබුණි.**

**(ඈ) අරමුණු ඉටු නොකිරිම.**

**-------------------------**

**2016 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි/ මංමාවත් ඉදි කිරීම් වැය විෂයය සඳහා වෙන් කර තිබූ රු.31,600,000 ක ප්‍රතිපාදනවලින් රු.27,982,162 ක් උපයෝජනය නොකිරීමෙන් මෙම කාර්යය ප්‍රශස්ථ මට්ටමින් ඉටු වී නොතිබුණි.**

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

**----------------------------------**

**පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.**

**(අ) 2012 වර්ෂයේ සිට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 11 ක පුරප්පාඩු පැවතිණි.**

**(ආ) 2016 මැයි මාසයේ ඇති වූ ජල ගැල්මෙන් හානියට පත් වූ මහජන පුස්තකාල ගොඩනැගිල්ලේ ලී බඩු උපකරණ හා පොත් 5000 ක් පමණ අනාරක්ෂිතව විනාශ වීමට ඉඩ හැර තිබුණි.**

**(ඇ) රු.22,269,045 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි අයිතම 22 ක අයිතිය සභාවට පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ දී ද කටයුතු කර නොතිබුණි.**

**(ඈ) ප්‍රාදේශීය සභාවට අයත් රු.1,097,000 ක් වටිනා සුසාන භූමි 20 ක අයිතිය සභාවට පවරා ගෙන නොතිබුණි.**

**(ඉ) සමාලෝචිත වර්ෂයේ සහ පෙර වර්ෂවල ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 5 දෙනෙකුගෙන් අය විය යුතු රු.393,962 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. 2017 මැයි 30 දිනට එම ශේෂය රු.384,392 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.**

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**(අ) 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වගන්තිය ප්‍රකාරව, සැලසුම් අනුමත කර ගැනීම සඳහා ඉකුත් වර්ෂ 7 ක් තුළ දී ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත්‍ර 869 කින් අයදුම්පත්‍ර 703 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 66 ක් සඳහා පමණි.**

**(ආ) ජල මනු මිල දී ගැනීම සඳහා මුද්‍රා තැබූ මිල ගණන් සඳහා ලංසු ආරාධනය සිදු කර ඇතත්, මුද්‍රා නොතිබූ ටෙන්ඩර් අයදුම්පත්‍ර 3 ක් පිළිගෙන තාක්ෂණික ඇගයීම් කමිටුවට, ඉදිරිපත් කර, අවම ලංසුකරු තෝරා ගෙන රු.1,890,000 ක ජල මනු මිල දී ගෙන තිබුණි.**

**3.4 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්.**

**2014 දෙසැම්බර් 31 දින රු.5,002,900 ක වටිනාකමකට සහා අරමුදල් යොදවා මිල දී ගෙන තිබුණු ජල මනු 1021 න් රු.2,254,000 ක් වටිනා ජල මනු 460 ක් සවි කිරීමකින් තොරව 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්ක්‍රීයව ගබඩාවේ රඳවා ගෙන තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට ජල මනු රහිත ජල සම්බන්ධතා 1535 ක් ඇතත්, මිලදී ගත් ජල මනු නිෂ්ක්‍රීයව ගබඩා කර තිබුණි.**

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය.**

**පහත දැක්වෙන කරුණු නිරික්ෂණය විය.**

**(අ) සිල්වාස් ලැන්ඩ් පාර හා කාණුව සෑදීම සඳහා රු.167,747 ක් සමාලෝචිත වර්ෂයේ දී ගෙවීම් කර තිබුණි. මේ සම්බන්ධව කරන ලද භෞතික පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.**

**(i) 1:2:4(මි.මි.19) කොන්ක්‍රීට් මිශ්‍රණයෙන් කොන්ක්‍රීට් යෙදීමට ඇස්තමේන්තු කර ඉදි කර තිබූ මාර්ග තලය කඩා පරීක්ෂා කිරීමේ දි නියමිත ප්‍රමිතියෙන් තොරව දූර්වල කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා තිබූ අතර, මාර්ග තලය මධ්‍යයේ හරස් අතට ඉරි තලා තිබුණි. කාණුව ඊට දුරස්ව යොදා තිබීමෙන් ජලය බැසයාමට තිබීම මාර්ග තලය ස්ථාන 2 කින් කඩා මාර්ගයේ හරස් අතට අගල් 4 එස්ලෝන් බට කැබලි 2 ක් යොදා තිබුණි.**

(ii) කොන්ක්‍රීට් මාර්ග තලය මධ්‍යය දක්වා විහිදෙන ආකාරයෙන් **1'-6"x 1'-6" x 16'** ප්‍රමාණයෙන් කාණුවක් ඉදි කර මතු පිට අඟල් හතරෙන් හතරට **(4"x4")** මි.මි.**12** දගර වානේ කම්බි යොදා කොටු දැළක් යොදා තිබීම හේතුවෙන්, මාර්ගයේ ගමන් කරන මගීන්ට හානිදායක තත්ත්වයක් පැවතුණි.

(ආ) බාරණ්ඩා සිට බෝහිල් දක්වා බෝහිල් ඉහළ පාර කොන්ක්‍රීට් කිරීමේ දී, කොන්ක්‍රීට් යෙදීමට පෙර මාර්ග තලය මත ව.මී.**461.7** ක පොලිතීන් යෙදීමට ඇස්තමේන්තු කර ඒ සඳහා රු.**32,319** ක් ගෙවා තිබූ නමුත්, මාර්ග තලය මත පොලිතීන් යොදා නොතිබුණි.

(ඇ) දඩු බැදිරුප්ප ගම මැද මාර්ගය **1:2:4**(මි.මි.**19**) කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදා ඉදිකිරීමට රු.**142,200** ක ඇස්තමේන්තු කර ඉදිකර තිබූ මාර්ග තලය කඩා පරීක්ෂා කිරීමේ දී එහි කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියෙන් තොරව පහසුවෙන් කැඩිය හැකි මට්ටමේ දූර්වලව පැවති අතර, **4"** ඝනකමින් ඉදි කළ යුතු කොන්ක්‍රීට් මාර්ග තලය **3"** ඝනකමකින් ඉදි කර තිබුණි.

(ඈ) හැතටන් කොටස වෙස්ට් හෝල් වත්ත කැටබුලා පාර කොන්ක්‍රීට් කිරීම සඳහා රු.**471,859** ක් ඇස්තමේන්තු කර කොන්ක්‍රීට් මාර්ග තලය ආරම්භයේ සිට මී.**12.6** ක් දුරින් හරස් අතට පුපුරා ගොස් තිබූ අතර, එම මාර්ගය **4"** ක් ඝනකමින් කොන්ක්‍රීට් යෙදිය යුතු වුවත්, පුපුරා ගොස් තිබූ ස්ථානය කඩා පරීක්ෂා කිරීමේ දි එහි ඝනකම **3"** ක්ව පැවතුණි. මාර්ග තලයේ වර්ග මීටර් **269.5** ප්‍රමාණයක පොලිතීන් ඇතිරීමට රු.**5,983** ක් ගෙවා ඇතත්, පොලිතීන් අතුරා නොතිබුණි.

**4.** ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.
-------------------------------------

**4.1** අයවැය පාලනය.
------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දි ආදායම් විෂයයන් **3** ක සියයට **43** සිට සියයට සියය ඉක්මාව ද, වියදම් විෂයයන් **8** ක සියයට **24** සිට සියයට **79** දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූ අතර, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

(ආ) එක් එක් වර්ෂයේ දි ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා පූර්ව වර්ෂයේ දි සංවර්ධන යෝජනා ලබා ගෙන ප්‍රමුඛතාවය සකස් කර ඉදිරි වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ව්‍යාපෘතීන් සඳහා විධිමත් පරිදි කාර්මික නිලධාරීන්ගේ ඇස්තමේන්තු ලබා ගැනීමකින් තොරව රු.2,700,000 ක දළ අගයක් යොදා සභා අරමුදල් සඳහා වූ සංවර්ධන ඇස්තමේන්තු පිළියෙළ කර සම්මත කර ගෙන තිබුණි.

**4.2** වාර්ෂික ප්‍රසම්පාදන සැළැස්ම.
--------------------------------
සමාලෝචිත වර්ෂය තුළ රු.7,377,210 ක ප්‍රාග්ධන වියදම් දරා ඇති නමුත්, ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3** සංයුක්ත සැළැස්ම.
--------------------
සමාලෝචිත වර්ෂයට අදාළ සංයුක්ත සැළැස්ම පිළියෙළ කර නොතිබුණි.

**4.4** අභ්‍යන්තර විගණනය.
-------------------------
සමාලෝචිත වර්ෂයේ දී සභාවේ ප්‍රමුණාවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**6.** පද්ධති හා පාලනය.
----------------------
පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) කොන්ත්‍රාත් පරිපාලනය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ණයගැතියන් හා ණයහිමියෝ